Prepared by- පී.ඊ.එම්.ආර්.ආර්.ආර්.ඒකනායක

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

ක්‍රියාකාරකම 2.4.1 :චරිත අභ්‍යන්තරය ඉස්මතුවන සේ රූපනයේ යෙදෙයි.

රූපනය යනු:- කිසියම් චරිතයක් අනු කරණය කිරීම ලෙස සරළව විග්‍රහ කල හැක.

සමාරෝපය යනු :- රූපනයේ යෙදෙන චරිය විෂයෙහි නළුවාගෙ අභ්‍යන්තරව හා භාහිරින් වන සූදානම,චරිතයකට ආරූඪවීම,අවේශවීම,වෙස්වලාගැනීම ලෙස අර්ථ දැක්විය හැක.

සමාරෝපය කොටස් 2කි.

1.අභ්‍යන්තර සමාරෝපය :- චරිතය රඟදැක්වීම සඳහා නළුවා විසින් කිසියම් අධ්‍යනයක් සිදු කළයුතුවේ. එය සංකීර්න ක්‍රියාවලියකි. චරිතයේ මනෝභාවයන් තේරුම් ගනිමින් නාට්‍ය වෙනත් චරිත සමග ඇතිවන සබඳතා හා ගැටීම් මගින් සිදුවන මනෝභාවයන් තේරුම් ගනිමින් අවස්ථානුරූපිව කටයුතු කිරීම මෙමගින් අපේක්ෂා කරයි.චරිත ස්වභාවයන් හදුනාගනිමින් රංගනයේ යෙදීම අභ්‍යනතර සමාරෝපය වේ. උදාහරණයක් ලෙස, බීමත් පුද්ගලයෙකු ලෙස රඟදැක්වීමට අවශ්‍ය නම්, ඇයි චරිතය බොන්නේ ? පානය කරන ලද මත්පැන් වර්ගය කුමක්ද? ඔහුගේ පවුල් පසුබිම කුමක්ද?චරිතයේ ඉතිහාසය කුමක්ද?සෙසු චරිත සමග ඇති අන්තර් සබඳතා මොනවාද? වැනි ගැටළු පිළිබඳව දැනුවත් භාවයක් ඇතිකර ගතයුතුවේ.චරිතය පිළිබඳව සවිඥ්ඥානකවීම, ආධ්‍යාත්මක බැදීම ලෙස හැඳින්විය හැක.එය කිසියම් චරිතයක් විෂයෙහි සාර්ථක අභ්‍යන්තර සමාරෝපය ලෙස හැඳින් විය හැක.

2.භාහිර සමාරෝපය :- චරිතයක් රඟ දැක්වීම සඳහා භාහිරින් සිදුවන සූදානම භාහිර සමාරෝපය ලෙස හැඳින්විය හැක. එනම් චරිතයට අනුව අංග රචනය,රංග භාණ්ඩ භාවිතය,රංග වස්ත්‍ර භාවිතය වැනි කරුණු දැක්විය හැක. උදාහරණයක් ලෙස පොලිස් චරිතයක් රඟ දක්වන්නේ නම් , පොලිස් නිල ඇඳුම,බැටන් පොල්ල, උඩු රැවුල වැනි භාහිර ස්වරූපයන් වලින් සැරසීම දැක්විය හැක. මෙලෙස භාහිර ස්වරූපයෙන් සැරසීම මගින් ප්‍රේක්ෂකයට චරිතය එකවර හඳුනා ගැනීමට පහසු වේ.

නළුවරණය හෙවත් චරිතයකට අවශ්‍ය නළුවා තෝරාගැනීම.

- නළුවරණය මුල්න්ම සිදු කරන්නේ නාට්‍ය රචකයාගේ මනසේය.එනම් ඇතැම් රචකයන් නාට්‍ය රචනා කිරීමේදී ඇතැම් චරිත නළුවන්ගේ හැකියාව, දක්ෂතාවය,භාහිර පෙනුම පිළිබඳ සැලකිලිමත්වෙමින් නාට්‍ය රචනා කරයි.එහිදී නළුවා විසින් පෙර රඟ දක්වන ලද චරිත ඉවහල්වේ.එලෙස රචකයා විසින් නළුවරණය සිදු කර නාට්‍ය නිෂ්පාදකවරයාට තම අදහස ප්‍රකාශ කර සිටියි.එහෙත් එය පිළිගැනීමට හෝ නොගැනීමට නිෂ්පාදකවරයාට නිදහස ඇත.
- දෙවනුව සැබෑ නළුවරණය සිදුකරන්නේ නාට්‍ය නිෂ්පාදක හෙවත් අධ්‍යක්ෂකවරයා විසිනි.නාට්‍ය පෙළෙහි ඒ ඒ චරිතවල ඔබින නළු නිළියන් තෝරා ගැනීම නාට්‍ය නිෂ්පාදනයේ ප්‍රධාන ක්‍රියාවලිය වේ.

- මෙහිදී චරිතයට අනුව නළුවාගේ හැඩරුව,ගායන,වාදන,නර්තන හැකියාව,රංගන ධාරිතාව,පිළිබඳ සැලකිලිමත්වීම විශේෂ වේ. එසේම නාට්‍යයයේ ශෛලියද වැදගත් සාධකයකි.
- ඇතැම් නාට්‍ය නිෂ්පාදකයින් පෞද්ගලික හැඳුනුම්කම් නළුවරණයට භාවිතා කරයි .එය නාට්‍ය සාර්ථකත්වයට භාධාවක් විය හැක.

**ක්‍රියාකාරකම :-**

**1.** නළුවෙකුට භාහිර සමාරෝපයට වඩා අභ්‍යන්තර සමාරෝපයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

**2.**නළුවරණය සිදුකිරීමේදී සැළකිලි මත්විය යුතු කරුණු විෂයභාර ගුරුවරයා සමග තවදුරටත් සාකච්ඡා කරන්න.